**ඇල්ල ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

------------------------

අවසාන තොග ගණනය හා ගිණුම්ගත කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට සේවක ඇප තැන්පත් පොලී රු.11,036 ක් හා ආයෝජන පොලී රු.63,750 ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සේවක ඇප තැන්පත් හා සේවක ඇප තැන්පත් පොලිය රු.111,636 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය තුල මිලදී ගෙන භාවිතා කර නොතිබූ රු.100,000 ක කම්බි දැල් සමාලෝචිත වර්ෂයේ අවසන් තොග ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී සභාව විසින් මිලදී ගෙන තිබුණු වටිනාකම රු.152,650 ක් වටිනා වත්කම් 04 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) භාවිතයට නොගත් රු.56,940 ක් වටිනා මිලි මීටර් 10 වානේ දගර කම්බි 39 ක් අවසන් තොගය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට ගෙවන ලද රු. 272,190 ක දායක ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

(උ) ආයුර්වේද අංශයේ අවසන් තොගය රු.73,628 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඌ) හෙට්ටිපොල මල්දරන් වත්තේ ඇල්ල ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම් රූඩ් 03 ක් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ රු.8,450,000 ක් ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා තිබුනද, එම වටිනාකම අත්තිකාරම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු.1,128,107 ක වැටුප් වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.33,470,802 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.26,019,732 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු.69,537,474 ක් වටිනා ගිණුම් විෂයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47(2) (1), (3) (1) වගන්ති සහ 49 (ආ) වගන්ති | අනවසර ඉදිකිරීම් 84 ක් සම්බන්ධව සභාව විසින් නීත්‍යානුකූලව කටයුතුකර නොතිබුණි. |
| (ආ) 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 ඒ(1) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ"Morning Dew" සංචාරක හෝටලය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට පෙර ඉදිකිරීම් සිදුකර තිබීම හේතුවෙන් දඩ හා ගාස්තු වශයෙන් රු.1,426,920 ක් අයකර ගෙන නොතිබුණු අතර, ඒ සඳහා නීත්‍යානුකූලව පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) 1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) 14 හා 127 වන රීතිය | වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරුකර ගැනීමකින් තොරව ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.2,339,042 ක් ගෙවීම් කර තිබුණි. |
| (ii) 29 වන රීතිය | ප්‍රාදේශීය සභා අරමුදලට ලැබෙන සියලු මුදල් දිනපතාම තැන්පත් කළ යුතු වුවද, දෛනික ලැබීම් නියමිත පරිදි බැංකු ගත කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 751 | සියලුම භාණ්ඩ වර්ගවල ලැබීම් හා නිකුත් කිරීම්වල විස්තර ඇතුළත් වන පරිදි තොග පොත් නඩත්තු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 752 හා 753 | භාණ්ඩ ලැබීම් නිකුත් කිරීම් සඳහා ද්‍රව්‍ය අධියාචනා පත්‍ර භාවිතා කිරීමෙන් තොරව භාණ්ඩ නිකුත් කර තිබුණි. |

(ඉ) ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1:6 වගන්තිය | ස්ථාන මාරුවීම් ලබාගොස් සිටි සේවකයින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.199,524 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.6,929,767 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,106,105 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.4,339,505 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ආදායමෙන් සියයට 44 ක් දෙසැම්බර් 31 දිනට හිඟ හිටව තිබුණි.

2.2.2 **කඩ කුලී**

----------

වැල්ලවාය පාර, පොලීසිය පාර, බණ්ඩාරවෙල පාර සහ බල්ලකෙටුව කඩ කාමර සඳහා 2014 අගෝස්තු මාසයේ සිට 2016 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට නව තක්සේරු කුලිය වෙනුවට පැරණි තක්සේරු කුලිය අයකිරීම හේතුවෙන් කඩ කුලී ආදායම රු.1,016,450 ක් අහිමිවී තිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ සහ මුද්දර ගාස්තු රු.3,661,507 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කාර්යසාධන ඇගයීම**

------------------------

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රදේශ 19 ක සිටින ප්‍රජාව සඳහා ජල ටැංකි 19 ක් ඉදි කර පානීය ජලය ලබාදීම සඳහා ක්‍රියාත්මක කර තිබූ ජල ව්‍යාපෘතිය අගය කල හැකි වුවද පුනරාවර්තන ආදායමට වඩා වියදම වැඩිවීමෙන් 2016 වර්ෂය තුළ රු.5,526,532 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) ජල යෝජනා ක්‍රමය මඟින් පවුල් 1433 කට ජලනල පහසුකම් ලබාදී තිබුණද ජල මනු සවිකර තිබුණේ පවුල් 155 කට පමණි.

(ඇ) පවුල් 1278 ක් සඳහා පානීය ජලය ලබා දීමට සභාව කටයුතු කර තිබුණද බොහෝ දිනයන්හි දී කාර්යක්ෂම හා ඵලදායි ජල සැපයුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

(අ) සභාව සතුව සුසාන භූමි 78 ක් තිබුනද, මෙම සුසාන භූමිය වෙනුවෙන් ඔප්පු (ඉඩම් පවරා ගැනීමේ නියෝග) ලබාගෙන නොතිබුණි.

(ආ) ගම් සභා ආඥා පනත යටතේ පවරා දෙන ලද ඉඩම් මේ දක්වා ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 **නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

(අ) 2011 වර්ෂයේ සිට ජෙනරේටරයක්, ඩීසල් වතුර මෝටරයක් සහ කසල අඹරන යන්ත්‍රයක් නිශ්කාර්යව ගබඩා පරිශ්‍රයේ රඳවාගෙන තිබුණි.

(ආ) 2014 වර්ෂයේ රුපියල් 2,222,335 ක් වියදම් කර අඩක් වැඩ නිමකළ නව සභා ගොඩනැගිල්ල නාය යෑමට ලක්වී 2014 වර්ෂයේ සිට මේ දක්වා නිශ්කාර්යව අභාවයට යමින් පැවතුණි.

3.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

2016 ජුනි මාසයේ දී වැලි සැපයීම සඳහා තෝරාගන්නා ලද සැපයුම්කරු සිටියදී ඔහුට වඩා සියයට 192 ක මිලෙන් වැඩි ලංසුවක් ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් අවස්ථා 03 කදී වැලි මිලදී ගැනීමෙන් රු.139,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

3.5 **කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

නාවුල්ල පාසල් ක්‍රීඩාංගණය අසලින් මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ගිවිසුම් කාලය තුළ වැඩ නිමකර සම්පූර්ණ නිමි වැඩ වටිනාකම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත බිල්පත් ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් වීම හේතුවෙන් රු.352,338 ක් කොන්ත්‍රාත්කරුට සහා අරමුදලින් ගෙවා තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) තොග පාලනය
(ඇ) ආදායම් අයකර ගැනීම
(ඈ) වාහන පාලනය
(ඉ) ඉදිකිරීම් පාලනය